## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා පත්කිරීම.

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට පත්කිරීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලබන මේ වන විට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද සියලු නිලධාරින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

| අනු අංකය | තනතුරු නාමය | සේවා ස්ථානය |
|---|---|---|
| 01 | අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සත්ත්ව සෞඛ්‍ය) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 03 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පශු සම්පත් සංවර්ධන) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 04 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන් සම්පාදක හා ජාත්‍යන්තර කටයුතු) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |

02. මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ලිපි ලේඛන ද සමඟ ගොනුවක් වශයෙන් සකස් කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2025.12.11** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් / අතින් භාරදීමෙන් පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

**"ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, පශු සම්පත් අංශය, 80/5, බිම් මහළ, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල"**

03. ලැබෙන අයදුම්පත් අතරින් සුදුසුකම් සපුරා ඇති සක්‍රිය සේවයේ නියුතු අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව කුසලතාවය, ඉහත එක් එක් තනතුරු සඳහා නිලධාරින්ගේ දැනුම කුසලතා මත වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යෝග්‍යතාවය සහ නිලධාරින්ගේ මනාප ප්‍රමුඛතාව ද පදනම් කරගෙන ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය ඇතුළත් ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

CamScanner

| සංරචකය - 01<br><br>(ඉතා හොඳයි- ලකුණු 5, හොඳයි - ලකුණු 3, සතුටුදායකයි - ලකුණු 1)<br><br>(ක්ෂේත්‍ර තුනට අදාළව ඉදිරිපත් කිරීම වෙන වෙනම සිදු කළ යුතුයි)<br><br>[එක් ඉදිරිපත් කිරීමකට ලකුණු 15 බැගින් (15x 3)<br>උපරිම ලකුණු 15] | | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සඳහා ලකුණු ලබා දීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | හඳුනාගෙන ඇති ගැටලුව, මෙ වන විට පවතින තත්ත්වය අවබෝධ කර ගැනීම, එය හදාරා ඇති ගැඹුර, යෝජනා කරන විසඳුම්වල තාර්කික බව, ශක්‍යතාවය (උපරිම ලකුණු 5) | | | ඉදිරිපත් කරන ලද කරුණුවල එකිනෙකට සම්බන්ධිත බව (උපරිම ලකුණු 5) | | | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරන ගැටලුවලට ලබා දෙන පිළිතුරු (උපරිම ලකුණු 5) | | |
| | | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි |
| 1.(a) | සත්ත්ව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව මේ වන විට ආමන්ත්‍රණය කර නැති නමුත් ආමන්ත්‍රණය කළ හැකි විභවයක් සහිත, හඳුනාගත් ප්‍රධාන ගැටලුවක් සහ ඒ ආශ්‍රයෙන් සිදු කරන විනාඩි 15ක ඉදිරිපත් කිරීමක් | | | | | | | | | |
| 1.(a)i | විසඳුම් නොවීම හේතුවෙන් සිදුවන බලපෑම | | | | | | | | | |
| 1(a)ii | යෝජනා කරන විසඳුම | | | | | | | | | |
| 1(a)iii | සම්බන්ධ කර ගත යුතු බාහිර පාර්ශවයන් | | | | | | | | | |
| 1(a) iv | සැලසුම් අංක 01 (1(a)ii) සාර්ථක නොවුනහොත් එළඹිය හැකි විසඳුම් | | | | | | | | | |
| | | | | | | | | | | |
| 1.(b) | පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව මේ වන විට ආමන්ත්‍රණය කර නැති නමුත් ආමන්ත්‍රණය කළ හැකි විභවයක් සහිත, හඳුනාගත් ප්‍රධාන ගැටලුවක් සහ ඒ ආශ්‍රයෙන් සිදු කරන විනාඩි 15ක ඉදිරිපත් කිරීමක් | | | | | | | | | |
| 1.(b)i | විසඳුම් නොවීම හේතුවෙන් සිදුවන බලපෑම | | | | | | | | | |
| 1(b)ii | යෝජනා කරන විසඳුම | | | | | | | | | |
| 1(b)iii | සම්බන්ධ කරගත යුතු බාහිර පාර්ශවයන් | | | | | | | | | |
| 1(b)iv | සැලසුම් අංක 01(1.(b)ii) සාර්ථක නොවුනහොත් එළඹිය හැකි විසඳුම් | | | | | | | | | |
| | | | | | | | | | | |

CamScanner

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.(c) | වැඩ සටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයට අදාළව මේ වන විට ආමන්ත්‍රණය කර නැති නමුත් ආමන්ත්‍රණය කළ හැකි විභවයක් සහිත හඳුනාගත් ප්‍රධාන ගැටලුවක් සහ ඒ ආශ්‍රයෙන් සිදු කරන විනාඩි 15ක ඉදිරිපත් කිරීමක් | | | | | | | | | |
| 1.(c)i | විසඳුම් නොවීම හේතුවෙන් සිදුවන බලපෑම | | | | | | | | | |
| 1.(c)ii | යෝජනා කරන විසඳුම් | | | | | | | | | |
| 1.(c)iii | සම්බන්ධ කරගත යුතු බාහිර පාර්ශවයන් | | | | | | | | | |
| 1.(c)iv | සැලසුම් අංක 01(1.(c)ii) සාර්ථක නොවුනහොත් එළඹිය හැකි විසඳුම් | | | | | | | | | |
| | සංරචකය - 02 | ප්‍රතිපත්ති සැලසුම්කරණය සම්බන්ධව පවතින අවබෝධය, ඉදිරිපත් කරන කරුණු හා යෝජනාවල පවතින නව්‍ය බවසහ පවත්නා ආර්ථික, සමාජීය තත්ත්වයන් මත වන ප්‍රායෝගික බව, ජාතික හෝ අන්තර්ජාතික මට්ටමෙන් ලබා ගත් අනුගත විය හැකි නිදසුන් ඉදිරිපත් කිරීම (උපරිම ලකුණු 5) | | | ඉදිරිපත් කරන ලද කරුණුවල එකිනෙකට සම්බන්ධිත බව (උපරිම ලකුණු 5) | | | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් වන ප්‍රතිචාරය සහ පිළිතුරු (උපරිම 5) | | |
| | | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි |
| 2. | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන්, ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ප්‍රතිපත්තිමය මට්ටමෙන් සිදුවිය යුතු යැයි ඔබ හඳුනාගන්නා තත්ත්වයන් (වෙනස්කම් / නව ප්‍රවේශයන් සම්බන්ධව විනාඩි 15ක ඉදිරිපත් කිරීමක් (උපරිම ලකුණු 15) | | | | | | | | | |
| 2.i | ක්ෂේත්‍රයට සමගාමීව ප්‍රතිපත්ති සම්පාදනයන් සිදු වී නොමැති ක්ෂේත්‍රයන් | | | | | | | | | |
| 2.ii | පවතින ප්‍රතිපත්තියන්හි සිදු විය යුතු යැයි හඳුනාගන්නා වෙනස්කම් | | | | | | | | | |
| | | | | | | | | | | |

CS CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 2.iii | ක්ෂේත්‍රයේ උන්නතිය හෝ ගැටලු විසඳීම පිණිස නිර්මාණය විය යුතු යැයි හඳුනාගන්නා ප්‍රවේශයන් (නව ප්‍රතිපත්ති) | | | |
| 2.iv | ජාතික මට්ටමින් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා මානව සම්පත සම්බන්ධීකරණය | | | |
| 2.v | ක්ෂේත්‍රයේ කටයුතුවලට අදාළව උපාය මාර්ගික සැලසුම්කරණයේදී අනුගමනය කළ හැකි ක්‍රමවේද | | | |
| 2.vi | ව්‍යාපෘති වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම පිණිස වන ක්‍රමවේද | | | |
| | සංරචකය - 03<br><br>(ඉතා හොඳයි - ලකුණු 2, හොඳයි - ලකුණු 1, සතුටුදායකයි - ලකුණු 0.5) | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි |
| 3. | සමස්ථයක් වශයෙන් සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය(උපරිම ලකුණු 10) | | | |
| 3.i | කාල කළමනාකරණය | | | |
| 3.ii | නිර්මාණශීලී බව | | | |
| 3.iii | ඉදිරිපත් කෙරුණු කරුණුවල තාර්කික බව | | | |
| 3.iv | සන්නිවේදන කුසලතා | | | |
| 3.v | භාෂාව හැසිරීම | | | |

රාජ්‍ය සේවා කොමිෂන් සභා නියමය පරිදි

**ඩී.පී. වික්‍රමසිංහ**
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

CamScanner

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමේ අයදුම් පත්‍රය 2025

01. සම්පූර්ණ නම :.............................................................................

.............................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................................

03. දැනට දරණ තනතුර :.............................................................................

04. සේවා ස්ථානය හා ලිපිනය :.............................................................................

05. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ මුල් පත්වීම දිනය :.............................................................................

06. I ශ්‍රේණියට පත් වූ දිනය :.............................................................................

07. විශේෂ ශ්‍රේණියට පත් වූ දිනය :.............................................................................

08. අයදුම් කරන තනතුරුවල ප්‍රමුඛතා අනුපිළිවෙල.

| අනු අංකය | තනතුර | මනාප ප්‍රමුඛතා අනුපිළිවෙලට පැහැදිලිව අංක යොදන්න |
|---|---|---|
| 1 | අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන)<br>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සත්ත්ව සෞඛ්‍ය)<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පශු සම්පත් සංවර්ධන)<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන් සම්පාදක හා ජාත්‍යන්තර කටයුතු)<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | |

මා විසින් ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් කර ඇති සියළු කරුණු සත්‍ය බවත්, සම්පූර්ණ තොරතුරු ඇතුළත් අයදුම්පත හා අදාළ සියළු ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් මේ සමග යොමු කරන බවත් ප්‍රකාශ කර සිටිමි. තවද මා විසින් මේ සමඟ සඳහන් කර ඇති තනතුරුවල ප්‍රමුඛතා අනුපිළිවෙල කිසිදු ලෙසකින් වෙනස් නොකරන බවද සහතික කරමි.

දිනය : ..........................................

..................................................
අයදුම්කරුගේ අත්සන

### ආයතන ප්‍රධානියාගේ සහතිකය

01. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ..................................................................... මහතා/ මහත්මිය/..............මෙනෙවිය..........................................................................(තනතුර) වශයෙන් ....................................................... හි ( සේවා ස්ථානය) සේවය කරන නිලධාරියෙකු බවත් ඔහු /ඇය විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව මාගේ දැනීමේ හැටියට නිවැරදි බවත් සහතික කරමි.

02. මෙම නිලධාරියා/ නිලධාරිනිය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත්කිරීම සලකා බැලීම සුදුසු බවට නිර්දේශ කරමි/නොකරමි.

දිනය : ....................................

.................................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා/ පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නිල මුද්‍රාව:

CamScanner

**අමාත්‍යාංශ/ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ........................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත්කිරීම සලකා බැලීම සම්බන්ධයෙන් ........................................................................................................ දෙපාර්තමේන්තු/ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය සමග මම ද එකඟවෙමි /එකඟ නොවෙමි.

දිනය : .....................................

.......................................................................

(අමාත්‍යාංශ ලේකම්/ පළාත් අමාත්‍යාංශ ලේකම්)

නිල මුද්‍රාව:

CS CamScanner